රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි : 02/2009

මගේ අංකය : ආ/9/5/2/විවිධ V
රාජ්‍ය පරිපාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

2009 අප්‍රේල් මස 07 වැනි දින

අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන්,
සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන්

<u>එක් භාෂාවකට වැඩි භාෂා ගණනක ප්‍රවීණතාවය ඇති රාජ්‍ය නිලධාරීන්ට දිරි දීමනා ගෙවීම.</u>

ඉහත කරුණ සම්බන්ධයෙන් නිකුත්කර ඇති, 1998.12.30 දිනැති අංක 29/98 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2004.06.23 දිනැති අංක 29/98(1) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. අ.පො.ස.(සා/පෙළ) සුදුසුකම් මත රාජ්‍ය සේවයට බඳවාගන්නා ලදුව ඉන්පසුව බඳවාගැනීමේ සුදුසුකම අ.පො.ස.(සා/පෙළ)ට වඩා ඉහළ දමා ඇති අවස්ථාවන්හිදී ඉහත චක්‍රලේඛ විධිවිධාන යටතේ දිරි දීමනා ලබාදීම පිළිබඳව විමසීම් මා වෙත ලැබී ඇත.

03. එබැවින් අ.පො.ස.(සාමාන්‍ය පෙළ) සුදුසුකම් මත රාජ්‍ය සේවයට බඳවාගැනීමෙන් අනතුරුව බඳවාගැනීමේ සුදුසුකම ඉහළ දමා ඇති සේවාවන් වලට අයත් නිලධාරීන්ට උක්ත චක්‍රලේඛ විධිවිධාන අනුව දිරි දීමනා ගෙවීමේදී පහත සඳහන් පරිදි කටයුතු කළ යුතුය.

03.01 පූර්ව සේවයේ ස්ථිර තනතුරක සිට නව සේවා ව්‍යවස්ථා/ බඳවාගැනීමේ පරිපාටි ක්‍රියාත්මක වීම මත, නව තනතුරකට අන්තර්ග්‍රහණය කර ඇති නිලධාරීන්ට භාෂා දීමනාව ගෙවීමේදී ඔවුන් පූර්ව සේවය සඳහා බඳවාගත් අධ්‍යාපන සුදුසුකම වන අ.පො.ස.(සාමාන්‍ය පෙළ) මට්ටමට අදාල සුදුසුකම් මත භාෂා දීමනාව ගෙවිය යුතුය. එසේ වුවද, එම මට්ටම යටතේ භාෂා දීමනාව ගෙවනු ලැබීමට ඔවුන් එම සුදුසුකම නව සේවා ව්‍යවස්ථාව/ බඳවාගැනීම් පරිපාටිය ක්‍රියාත්මක වීමට පෙර ලබා තිබිය යුතුය.

03.02 එසේම, එම නිලධාරීන් නව සේවා ව්‍යවස්ථා/ බඳවාගැනීම් පරිපාටි විධිවිධාන පරිදි තනතුරට අදාලව ශ්‍රේණිගත උසස්වීම් ලැබුවද, අ.පො.ස.(සාමාන්‍ය පෙළ) සුදුසුකම යටතේම නව දුරටත් භාෂා දීමනාව ලබාගැනීමට අවස්ථාව ලබාදිය යුතුය.

03.03 සේවා ව්‍යවස්ථාවල/ බඳවාගැනීම් පරිපාටිවල බඳවාගැනීමේ සුදුසුකම් ඉහළ දැමීමෙන් අනතුරුව එම අධ්‍යාපන සුදුසුකම් මත සේවයට බඳවාගන්නා ලද නිලධාරීන්ට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 29/98 හා 29/98(1) හි විධිවිධාන පරිදි අදල භාෂා දීමනා හිමිකම තීරණය කිරීමේදී ඉහළ අධ්‍යාපන සුදුසුකම පදනම් කරගත යුතුය.

ඩී. දිසානායක
ලේකම්
රාජ්‍ය පරිපාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය